**YAMAHA වෙළඳ නියෝජිත සමුළුව හා සම්මාන රාත්‍රිය 2018**
**උත්කර්ෂයෙන් දිදුලයි.**




ලොව සුපතල Yamaha මෝටර් සමාගමේ ජපාන නියොජිතවරුන් හා මෙරට මෝටර් රථ අලෙවියේ ප්‍රමුඛයා වන AMW ආයතනයේ කළමණාකාරීත්වයේ සහභාගීත්වයෙන් "Yamaha වෙළෙඳ නියෝජිත සමුළුව හා සම්මාන රාත්‍රිය 2018" පසුගිය දා කොළඹ ගලධාරී හෝටලයේදී අතී උත්කර්ෂවත් ලෙස පැවැත්වීය. මුළු දිවයිනතම ආවරණය වන පරිදි AMW ආයතනය සමගින් අත්වැල් බැද සිටින 235 කට අධික අලෙවි නියෝජිතවරුන් මෙම සුවිශේෂි සම්මාන රාත්‍රියට සහභාගී විය.

මෙහිදී 2018 වර්ෂයේදී ළගා කරගන්නා ලද අරමුණු හා 2019 වර්ෂය සදහා නව අරමුණු සාක්ෂාත් කරගැනීම පිළිබඳව සාකච්ඡා කිරීම සිදු වු අතර එහි පැමිණි සිටි අලෙවි නියෝජිතයන් අතරින් 35 දෙනෙකුට ජපානයේ සංචාරයක නිරත වීමට මෙහි දි අවස්ථාව හිමි විය. මෙහි සිදු වු විශේෂිත දෙය වන්නේ Yamaha Riding Academy සහ Racing ශ්‍රී ලංකාව සදහා හදුන්වා දීමයි.එමගින් මෙරට සිටින දක්ෂතම මෝටර්සයිකල් ධාවකයින් ජාත්‍යන්තරය සදහා ගෙනයාම මෙහි අරමුණයි.

පසුගිය වසර තුල අලෙවි ඉලක්ක සපුරා ගත් ආකාරයන් හා ඒ වූ පෙර සුදානම මෙන්ම, එම අලෙවි ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා සිදු කළ අලෙවි උපක්‍රම පිළිබඳවත් දෙපාර්ශවය විසින් අදහස් හුවමාරු කර ගැනීම මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය. 2019 වසරේ අලෙවි ඉලක්කයන් සපුරාගැනීම සදහා අවශ්‍ය ක්‍රමෝපායන් හා ඒ සදහා මුහුණ දීමට සිදුවන අභියෝගයන්ද, සමස්ථ විකුණුම් ක්‍රියාවලියතුල සිදුකළ යුතු වෙනස්කම් හා නව ආදේශකයන් පිළිබදවත් මෙහිදී දීර්ඝලෙස සාකච්ඡා කෙරිණි. දශක හතකට ආසන්න කාලයක් පුරාවට මෙරට ජනතාවගේ විශ්වාසය දිනු AMW සමාගම, පාරිභෝගික ජනතාව හා AMW සමාගම යා කරන ශක්තිමත් පාළම මේ දැවැන්ත අලෙවි නියෝජිත ජාලයයි. එවන් වු විශිෂ්ඨයන් පිරිසක් ඇගයීම සඳහා සංවිධානය කරනු ලැබූ මෙම සම්මාන රාත්‍රියෙදී, විශිෂ්ඨතම අලෙවි නියෝජිතයන් උදෙසා වටිනා ත්‍යාග හා සහතිකපත් ද ප්‍රධානය කරනු ලැබීය.

ඉතා දැකුම්කළු නර්ථන අංගයන්ගෙන් සහ සුමිහිරි සංගීතයන්ගෙන් හැඩගැන්වී තිබූ මෙම අලෙවි නියෝජිත සම්මාන රාත්‍රිය, ඊට සහභාගි වු සියලූම අලෙවි නියෝජිතවරුන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයටත් විනෝදාස්වාදය ලබාදුන් සොදුරු මතක රැන්දු සුන්දර රාත්‍රියක් බවට පත්විය.





